 ISSN 2362-0412

# ශ්‍රී ලංකාවේ පැරණි වාරි උරුමයේ සිදු වූ සංරක්ෂණ හා නඩත්තු ක්‍රියාවලිය : ආරම්භක යුගයේ සිට ක්‍රි.ව. 1948 දක්වා.

ඩී.සී. චිත්‍රානන්ද*, ලක්මිණී ගමගේ

*ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්ව විද්‍යාලය*

*Corresponding author: *chithranandac@yahoo.com*

***සංක්ෂේපය***

ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාවය හා බැඳුණු පොදු සංකේතය පුරාණ වාරි උරුමය යි. එය ආසන්න වශයෙන් ක්‍රිස්තු පූර්ව පහ හෝ හය සියවස්වල ආරම්භව ක්‍රිස්තු වර්ෂ දොළොස් වන සියවස පමණ වනවිට සංවර්ධනයේ උපරිම අවස්ථාවට ළගා වී තිබුණි. වාරි කර්මාන්ත වටා ලාංකීය ශිෂ්ටාචාරය හා සංස්කෘතික උරුමය වැඩී වර්ධනය විය. ලංකාවේ වාරි උරුමය වැව, අමුණ , ඇළ, ආශ්‍රිතව ඇතිවූ ඉදිකිරීම් සහ ඒ ආශ්‍රිතව ගොඩනැගුණ භූදර්ශනය, ජනාවාස රටාවන් ආදි ස්පර්ශනීය උරුමය මෙන්ම වාරිමාර්ග හා බැඳුණු සිරිත් විරිත් චාරිත්‍ර, පූජාකර්ම, ජන කතා හා ජන ගායනා මෙන්ම වාරිමාර්ග හා බැඳුණු ජනවහර ආදී අස්පර්ශනීය උරුම අංගයන් ගෙන් ද සමන්විත වේ. බොහෝ පැරණි වාරි කර්මාන්ත සජීවී උරුමයන් ලෙස වර්තමානයේ දී ද ක්‍රියාකාරී ස්වරූපයෙන් පවතී. ඒ සඳහා බලපෑ ප්‍රධාන හේතු සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ ලංකාවේ පැරණි වාරි කර්මාන්ත පද්ධතියේ ආරම්භක යුගයේ සිට ක්‍රි.ව. 1948 තෙක් කිනම් ආකාරයක සංරක්ෂණ හා නඩත්තු කටයුතු සිදුවූවා ද ? යන්න ය. මෙම පර්යේෂණය ගුණාත්මක ප්‍රවේශය තුළ ස්ථානගත වී ඇති හෙයින් සිද්ධි අධ්‍යයනය යන ක්‍රමවේදය තුළ භාවිතවන ලේඛනාගාර වාර්තා, ලියකියවිලි, සෘජු නිරීක්ෂණය , භෞතික පුරාවිද්‍යා අවශේෂ පරීක්ෂා කිරීම, යන මූලාශ්‍රන් මේ සඳහා භාවිත කළේය. ඉතා ඉහළ සණත්වයකින් වියළි කලාපීය තැනිතලා භූමිය පුරා ව්‍යාප්තව පැවති වාරි පද්ධතිය මුල්ම අවධියේ ඒවා ඉදිකළ ජනතාව විසින්ම සිදුකළ නඩත්තු කටයුතු මගින් ආරක්ෂාවූ ආකාරය ද, පසුව බලයට පත්වූ සෑම පාලකයෙකුම රාජ්‍ය මැදිහත්වීම මත සිදුකළ වාරි කර්මාන්ත සංරක්ෂණය කිරීම්, නඩත්තුකිරීම, පවත්නා වාරිමාර්ග පුළුල් කිරීම්, අළුත් වාරිමාර්ග ඉදිකිරීම්, හමුවේ දිගින් දිගටම ආරක්ෂාවූ ආකාරය ද, ලංදේසි, ඉංග්‍රීසි ආදී බටහිර ජාතීන්ගේ පාලන කාල තුළ දී , ලංදේසී ලංකාවේ දකුණු හා නැගෙනහිර මුහුදුබඩ ප්‍රදේශවල පැරණි වාරි කර්මාන්ත සංරක්‍ෂණය කිරීම ද, ඉංග්‍රීසි ලංකාවේ වියළි කලාපය පුරා සියවස් ගණනාවක් තිස්සේ අතහැර දමා තිබූ දැවැන්ත වාරි කර්මාන්ත ජාලය සංරක්‍ෂණය කිරීමට ගෙන තිබූ බොහෝ සාධනීය ක්‍රියාමාර්ගයන් ද ඓතිහාසික හා පුරාවිද්‍යා මූලාශ්‍රයන් පදනම් කරගනිමින් හඳුනාගතහැකිවීම මෙම අධ්‍යනයේ ප්‍රතිඵලයයි.

***Keywords:*** *සංරක්ෂණය, වාරිමාර්ග, උරුමය, පුරාණ, කර්මාන්තය*